පොලිස් මූලස්ථානය, කොළඹ, ශ්‍රී ලංකාව
பொலிஸ் தலைமையகம், கொழும்பு, இலங்கை
POLICE HEAD QUARTERS, COLOMBO, SRI LANKA

තැ. පෙ. අංකය / த. பெ .இல. / P. O. Box No. — 517

දුරකථනය / தொலைபேசி / Telephone — 011-2384024, 011-2395605

Website: www.police.lk

ෆැක්ස් / தொலைநகல் / Fax No. — 011- 2329500

ඊ - මේල් / மின்-அஞ்சல் / E-Mail — Policemedia@police.lk

මගේ අංකය / எனது இல. / My No. — PMD / PR / 60 / 22

ඔබේ අංකය / உமது இல. / Your No. —

දිනය / திகதி / Date — 2022.01.10 පැය 1930

# මාධ්‍ය නිවේදනයයි

## පාස්කු ඉරිදා වින්දිතයන් සඳහා වූ ගෝලීය යුක්ති සංසදය මඟින් සංවිධානය කර අති උතුම් කාදිනල් මැල්කම් රංජිත් හිමිපාණන්ගේ ප්‍රධානත්වයෙන් Zoom තාක්‍ෂණය ඔස්සේ පවත්වන ලද සම්මන්ත්‍රණයේ දී උන් වහන්සේ විසින් සිදු කරන ලද ප්‍රකාශය සම්බන්ධව

"පාස්කු ඉරිදා වින්දිතයන් සඳහා වූ ගෝලීය යුක්ති සංසදය" විසින් 2022 ජනවාරි 08 වන සෙනසුරාදා දින සංවිධානය කරන ලද ශ්‍රී ලංකාවේ පාස්කු ඉරිදා බෝම්බ ප්‍රහාරයේ වින්දිතයන් සඳහා යුක්තිය (සත්‍ය සොයා යන සම්මන්ත්‍රණය) මැයෙන් Zoom තාක්‍ෂණය ඔස්සේ පැවැත් වූ සම්මන්ත්‍රණයේ දී එහි ප්‍රධානත්වය දැරූ අගරදගුරු අති උතුම් කාදිනල් මැල්කම් රංජිත් හිමිපාණන් විසින් පහත සඳහන් ප්‍රකාශ පාස්කු ඉරුදින ප්‍රහාරයේ විමර්ශන සම්බන්ධයෙන් අවධාරණය කරමින් සඳහන් කර තිබිණ.

- පාස්කු ඉරුදින ප්‍රහාරය වර්තමාන රජයේ කුමන්ත්‍රණයක් බව
- විමර්ශකයින් මෙම ප්‍රහාරය පිළිබඳව තොරතුරු අනාවරණය කිරීමට අකමැති බව
- මහජනතාවගේ ඡන්දය ලබා ගැනීම සඳහා ප්‍රහාරය පිළිබඳ තොරතුරු දැන දැන එය සිදු වීමට ඉඩ දී තිබෙන බව
- නියෝජ්‍ය පොලිස්පති නාලක ද සිල්වා මහතා අත්අඩංගුවට ගැනීමට කටයුතු කළේ ඔහු සහරාන් හෂීම් ව අත්අඩංගුවට ගැනීමට වරෙන්තුවක් ලබා ගෙන තිබිය දී බව
- පාර්ලිමේන්තු තේරීම් කාරක සභාව විසින් නිර්දේශ කර තිබෙන කරුණු පිළිබඳව විමර්ශන සිදු නොකරන බව
- දේශපාලකයන් විසින් පොලිසියට බලපෑම් කළ බව සහ පොලිසිය ස්වාධීන විය යුතු බව
- පොලිස්පති විසින් දේශපාලකයන්ගේ ප්‍රකාශයක් ජනතාව වෙත ඉදිරිපත් කළ බව

බුද්ධි අංශ, ත්‍රස්ත මර්ධන හා විමර්ශන කොට්ඨාසය සහ අපරාධ පරීක්‍ෂණ දෙපාර්තමේන්තුව සහරාන් හෂීම් සම්බන්ධව යම් විමර්ශන කිහිපයක් සිදු කර තිබෙන අතර එම කාලසීමාවේ ත්‍රස්ත මර්ධන හා විමර්ශන දිසාව භාරව කටයුතු කලේ නියෝජ්‍ය පොලිස්පති නාලක ද සිල්වා මහතා වන අතර, අපරාධ පරීක්‍ෂණ දෙපාර්තුමේන්තුවේ අධ්‍යක්‍ෂ ලෙස ශානි අබේසේකර මහතාත් එහි ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති ලෙස රවී සෙනෙවිරත්න මහතාත් කටයුතු කර ඇත.

ත්‍රස්ත මර්ධන හා විමර්ශන කොට්ඨාසය විසින් 2018.07.09 වන දින සහරාන් හෂීම් අත්අඩංගුවට ගැනීම සඳහා කොළඹ ප්‍රධාන මහේස්ත්‍රාත් අධිකරණයෙන් විවෘත වරෙන්තුවක් ලබාගෙන ඇති අතර එයට පෙර කාත්තන්කුඩි අලියාර් හන්දියේ සිදු වූ ගැටුමකට අදාළව කාත්තන්කුඩි පොලිස් ස්ථානය මඟින් මඩකලපුව මහේස්ත්‍රාත් අධිකරණයෙන් ද 2017.08.17 වන දින වරෙන්තුවක් ලබා ගෙන තිබී ඇත.

මෙවැනි තත්ත්වයක් තිබිය දී නියෝජ්‍ය පොලිස්පති නාලක ද සිල්වා මහතා 2018.10.25 වන දින අත්අඩංගුවට ගැනෙන්නේ එවකට හිටපු අතිගරු ජනාධිපතිතුමා සහ වර්තමාන අතිගරු ජනාධිපතිතුමා නැගෙනහිර ප්‍රදේශයේ දී ඝාතනය කිරීමට මෙන් ම සහකාර පොලිස් අධිකාරිවරයකු කොළඹ ප්‍රදේශයේ දී ඝාතනය කිරීමටත්, තවත් ජ්‍යෙෂ්ඨ පොලිස් නිලධාරීන් කිහිප දෙනෙකු සහ පොලිස් කොමිසමේ නිලධාරියකු ඔවුන් දරන තනතුරුවලට හානි පැමිණවීමේ අදහසින් ක්‍රියා කිරීමටත් සිදු කරන ලද කුමන්ත්‍රණයකට අදාළව වන අතර, ඔහු අත්අඩංගුවට ගැනීම සිදු කර ඇත්තේ එවකට අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වශයෙන් ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ශානි අබේසේකර මහතා කටයුතු කරමින් සිටිය දී වේ.

සහරාන් හෂීම්ට එරෙහිව වරෙන්තු නිකුත් කර තිබිය දී, නියෝජ්‍ය පොලිස්පති නාලක ද සිල්වා මහතා මාස 03 කට අධික කාලයක් ත්‍රස්ත මර්ධන හා විමර්ශන කොට්ඨාසය අධීක්ෂණය කළ ද ඔහුට එරෙහිව එම වරෙන්තු ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොමැති බව ලේඛන පරීක්ෂා කිරීමේ දී නිරීක්ෂණය වන අතර, නාලක ද සිල්වා මහතා විසින් සිදුකරන ලදැයි කියනු ලබන අපරාධමය කුමන්ත්‍රණයක් හේතුවෙන් ඔහු අත්අඩංගුවට පත්වීම, එම වරෙන්තු ක්‍රියාත්මක කිරීම නොකර සිටීම සඳහා කරන ලද කුමන්ත්‍රණයක ප්‍රතිඵලයක් ලෙස හඳුන්වාදීම හුදු නිෂ්ඵල තර්කයක් බව, නාලක ද සිල්වා මහතා අධීක්ෂණය නොකළ කාත්තන්කුඩි පොලිස් ස්ථානය මඟින් 2017.08.17 වන දින වරෙන්තුවක් ලබා ගෙන තිබීම මඟින් පෙන්වා දිය හැකි ය.

2018.07.09 දින සිට 2018.10.25 දින නාලක ද සිල්වා මහතා අත්අඩංගුවට පත් වන තුරු ම එම වරෙන්තුව ක්‍රියාත්මක කිරීම සඳහා කිසිඳු නිලධාරියකු යොදවා තිබී නොමැති අතර, ඔහු අත්අඩංගුවට ගැනීමෙන් පසු අවස්ථා කිහිපයක දී ම ත්‍රස්ත මර්ධන හා විමර්ශන කොට්ඨාසයේ අධ්‍යක්ෂවරුන් විසින් සහරාන් හෂීම් අත්අඩංගුවට ගැනීම සඳහා නිලධාරීන් යොමු කර ඇත.

නියෝජ්‍ය පොලිස්පති නාලක ද සිල්වා මහතාගේ යම් යම් විෂමාචාරයන් සම්බන්ධයෙන් මේ වන විටත් විශේෂ විමර්ශන ඒකකය මඟින් විමර්ශන ගණනාවක් සිදු කරමින් පවතී.

කෙසේ වුව ද, ඕනෑම විමර්ශනයක විමර්ශන බලධරයා වන්නේ, අදාළ පොලිස් ස්ථානයේ හෝ විමර්ශන ඒකකයේ ස්ථානාධිපති වරයා වන අතර, වරෙන්තුකරුවන් අත්අඩංගුවට ගැනීම ඇතුළුව විමර්ශනයේ සියලු කටයුතු සම්බන්ධව ඔහු විසින් වගකිව යුතු වීම ලංකාවේ පවතින නෛතික තත්ත්වයයි. ඒ අනුව යම් අධීක්ෂණ නිලධරයකු අත්අඩංගුවට ගෙන රඳවා තබා ගැනීම මඟින් ස්ථානාධිපතිවරයකුගේ බලතල යටපත් කළ හැකිය යන්න පැවසීම හුදු ප්‍රකාශයක් පමණක් වන අතර, එහි කිසිඳු නෛතික සත්‍යතාවයක් නොමැති බව පැහැදිළි කරුණකි.

එසේ ම, අගරදගුරු අති උතුම් කාදිනල් හිමිපාණන් වහන්සේ විසින් අපක්ෂපාතීව සහ නිවැරදිව තම රාජකාරි ඉටු කරන නිලධරයන් ලෙස හඳුන්වා දී ඇති ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී ශානී අබේසේකර සහ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රවී සෙනෙවිරත්න යන නිලධරයන් විසින් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව අධීක්ෂණය කරන ලද කාලසීමාව තුළ දී සහරාන් හෂීම් ට එරෙහි එම වරෙන්තු නිකුත් කර ඇති බවත්, එසේ තිබිය දී අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් නියෝජ්‍ය

පොලිස්පති නාලක ද සිල්වා මහතා අත්අඩංගුවට ගෙන ඇති බවත්, ලේඛන අනුව පෙනී යන බැවින් අති උතුම් කාදිනල් හිමිපාණන් වහන්සේ විසින් පක්ෂපාතීව හා කුමන්ත්‍රණකාරීව කටයුතු කළ නිලධරයන් වශයෙන් හඳුන් වන්නේ කවුරුන් ද යන්න පිළිබඳ ව ගැටලු මතු වේ.

එසේ ම, බුද්ධි අංශ විසින් ලබාදෙන ලද බුද්ධි තොරතුරු පිළිබඳ නිසි අවධානයකින් හෝ කටයුතු නොකර සිටීම හේතුවෙන් හිතාමතා එම ප්‍රහාරය සිදු වීමට ඉඩ හැරියා ද යන්න පිළිබඳව, ගරු නීතිපති තුමා විසින් දෙන ලද උපදෙස් මත සිදු කරන ලද විමර්ශන වල අවසන් ප්‍රතිඵලය ලෙස මහාධිකරණයේ නඩු පැවරීමට කටයුතු කර ඇති බැවින් සහ එය අධිකරණමය කරුණක් බැවින් ඒ සම්බන්ධව කරුණු ඉදිරිපත් කිරීම සදාචාරාත්මක නොවන බව සඳහන් කරමි.

යම්කිසි තැනැත්තකුට එරෙහි ව අපරාධමය චෝදනාවක් සිදු කිරීම සඳහා සාක්ෂි ආඥා පනතේ නෛතික විධිවිධාන අනුව කරුණු මත පදනම් ව කටයුතු කරන අතර, හුදු සාක්ෂිමය වටිනාකමක් නොමැති ප්‍රකාශ හෝ වාර්තා මත කිසිම අවස්ථාවක දී අපරාධ චෝදනා ඉදිරිපත් කිරීම සඳහා ක්‍රියා කරනු නොලබයි.

මෙවැනි තත්ත්වයක් යටතේ අගරදගුරු අති උතුම් කාදිනල් මැල්කම් රංජිත් හිමිපාණන් විසින් කරන ලද චෝදනාවන් ප්‍රතික්ෂේප කරන අතර, ශ්‍රී ලංකා පොලිසිය මගින් පාස්කු ප්‍රහාරය සම්බන්ධව නිවැරදිව සහ සාක්ෂිමය කරුණු මත අනාවරණය කර ගත් තොරතුරු අනුව ගරු නීතිපති තුමා විසින් මේ වන විටත් මහාධිකරණයේ නඩු 12 ක් පමණ පවරමින් සැකකරුවන් 42 කට අධිචෝදනා ඉදිරිපත් කර ඇති බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.

මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය
පොලිස් මාධ්‍ය කොට්ඨාසය